# සංවර්ධන ලොතරැයි මණ්ඩලය
# அபிவிருத்தி லொத்தர் சபை
# DEVELOPMENT LOTTERIES BOARD
**Ministry of Finance**

මගේ අංකය / எனது இலக்கம் / My No. DLB/PRO/406
2023.05.25

ඔබේ අංකය / உமது இலக்கம் / Your No.

..........................................................

..........................................................

..........................................................

මහත්මයාණෙනි,

**<u>ඉවතලන කඩදාසි / අවලංගු කරන ලද ලොතරැයිපත් අලෙවි කිරීම සඳහා ලංසු කැඳවීම</u>**

මෙම ආයතනයේ අලෙවියෙන් බැහැර කෙරෙන, අවලංගු කරන ලද ලොතරැයි ටිකට්පත් සහ දෛනිකව එකතුවන සාමාන්‍ය කඩදාසි අලෙවි කිරීම සඳහා පහත සඳහන් කොන්දේසි වලට යටත්ව මේ පිළිබඳව උනන්දුවක් දක්වන ආයතන සහ පුද්ගලයින් වෙතින් ලංසු මිල ගණන් කැඳවනු ලැබේ.

මීට අදාලව මුද්‍රා තබන ලද ඔබගේ මිල ගණන් **2023.06.08 දින ප.ව. 2.30** ට පෙර සභාපති, සංවර්ධන ලොතරැයි මණ්ඩලය, අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 02 ලිපිනයේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කරන ලෙස මින් දන්වමි.

**විශේෂ කරුණු / කොන්දේසි :**

1. සාමාන්‍යයෙන් මාසිකව මෙට්‍රික් ටොන් 10 ක් පමණ කඩදාසි තොග බැහැර කරන අතර එම ප්‍රමාණය සැලකිල්ලට ගෙන මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. (ප්‍රමාණය වෙනස්විය හැක)
2. කඩදාසි කි.ග්‍රෑ. 01 ක් මිලදී ගැනීම සඳහා ඔබ විසින් ඉදිරිපත් කරන මිල ගණනට අමතරව 15% ක වැට් බදු ප්‍රතිශතයක් ගෙවීමට සිදුවන අතර එම කරුණද සැලකිල්ලට ගෙන මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.
3. ඔබ විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී **රු.10,000.00 ක ආපසු ගෙවන ඇප තැන්පතු මුදලක්** සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ තැන්පත් කළ යුතු අතර, එම ලදුපතේ පිටපතක් ලංසු මිල ගණන් සමඟ ඇමිණිය යුතුය. ඔබගේ මිල ගණන් සඳහා දින 30 ක වලංගු කාලයක් පැවතිය යුතු අතර එම කාලය තුල මිල ගණන් ඉල්ලා අස්කර ගැනීම හෝ කඩදාසි මිලට ගැනීම සිදු නොකළහොත් ඔබගේ එම ඇප මුදල මණ්ඩලය සතු කෙරේ.
4. අවලංගුකර ඉවත් කරන මුද්‍රිත ලොතරැයිපත් සහ ඉවතලන සාමාන්‍ය කඩදාසි මෙම කඩදාසි තොග වලට ඇතුලත්ව පවතී.
5. අවලංගු කරනලද ටිකට්පත් කුඩා තීරු වශයෙන් කපා ගෝනිවල බහාලීමට කටයුතු යොදා ඇති හෙයින් එහි ඇසුරුම් වියදම් (ගෝනිය සඳහා) කඩදාසි ගැනුම්කරු විසින් අපසු ගෙවීම හෝ හිස් ගෝනි සියල්ල ආපසු මණ්ඩලයට භාරදිය යුතුය.

6. ඉහත කරුණු වලට යටත්ව රැගෙන යන කඩදාසිවල බර කිරීමෙන් අනතුරුව ගෙවීම් නිරවුල් කළ යුතු අතර ගෙවීම් පසුව සිදු කරන්නේ නම් රු.50,000.00 ක ආපසු ගෙවන ඇප තැන්පතු මුදලක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ තැන්පත් කර තිබිය යුතු වේ.
7. කඩදාසි තොගවල බර කිරා බැලීම කාර්යාලය ආසන්නයේ පිහිටි පාලම් තරාදියක් වෙත රැගෙන ගොස් සිදු කරන අතර බර කිරීමට අදාල තරාදි ගාස්තු ගෙවීම කඩදාසි මිලදී ගනු ලබන්නා විසින් සිදුකළ යුතුය.

මිල ගණන් ඉදිරිපත් කරනු ලබන කවරයේ වම් ඉහල කෙලවර "ඉවතලන කඩදාසි මිලදී ගැනීම සඳහා මිල ගණන්" ලෙස සටහන් කළ යුතුය.

මෙයට - විශ්වාසී,

පී.ඩී. ප්‍රේමලින්ත
ස.සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)